2019.10.28. මව්බිම පිටුව 2

# ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධන වේගය පහත වැටිලා

## මහ බැංකුවේ හිටපු අධිපති අජිත් නිවාඩ් කබ්රාල්

**ජයසූරිය උඩුකුඹුර**

ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධන වේගය මේ වසරේ දෙවැනි කාර්තුවේදී 1.6% දක්වා පහත වැටී ඇති බව ශ්‍රී ලංකා මහ බැංකුවේ හිටපු අධිපති අජිත් නිවාඩ් කබ්රාල් මහතා සඳහන් කරයි. මේ අතර කෘෂිකර්මාන්තය 3.5% සිට 1% දක්වා ද සේවා අංශය 4.1% සිට 1.6% දක්වාද පහත වැටී ඇති බව කබ්රාල් මහතා පෙන්වා දී ඇත.

මේ අතර කාර්මික අංශය 3% සිට 1.4% දක්වා පහත වැටී තිබේ. තේ මිල පහත වැටීම හා කම්කරුවන් වතු වැඩවලින් ඉවත් වීම නිසා වැවිලි කර්මාන්තය පවත්වාගෙන යෑමේ අභියෝගයක් පැන නැඟී ඇති බව ද කබ්රාල් මහතා පෙන්වා දෙයි.

සත්‍ය තත්ත්වය එසේ වුවද රජය ශ්‍රී ලංකා ආර්ථික තොරතුරුවලට කෘත්‍රිම අගයක් එකතු කර ඇති බව ආර්ථික විශ්ලේෂකයන් පෙන්වා දී ඇති බව ද කබ්රාල් මහතා සඳහන් කරයි.